# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

**48 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2022 - (2022 ඔක්තෝබර් මස 21, 22, සහ 23)**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 48 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2022 ඔක්තෝබර් මස 21, 22 සහ 23 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සැසිවාර 09 කින් පවත්වනු ලැබේ.

පැවැත්වීමට නියමිත සැසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

පළමුවන සැසිය - **2022 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදි උපාධිය, ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

දෙවන සැසිය - **2022 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය, විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණ උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

තෙවන සැසිය - **2022 ඔක්තෝබර් මස 21 වැනි දින ප.ව. 02.30 සිට ප.ව. 04.30 දක්වා**

තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදි ගෞරව උපාධිය , ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදි ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

සිව්වන සැසිය - **2022 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ.ව.8.00 සිට පෙ.ව.10.00 දක්වා**
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ වාණිජවේදි (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථිකවිද්‍යා) (විශේෂ) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

පස්වන සැසිය - **2022 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ.ව.11.00 සිට ප.ව.01.00 දක්වා**
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය, විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

හයවන සැසිය - **2022 ඔක්තෝබර් මස 22 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා**
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ) උපාධිය, විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ)

උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

හත්වන සැසිය - **2022 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා** ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය, විද්‍යාවේදී ගෞරව ව්‍යවහාරික විද්‍යා උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

අටවන සැසිය - **2022 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා**

ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය, විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය, විද්‍යාවේදී හෙද ගෞරව උපාධිය, ඖෂධවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

නවවන සැසිය - **2022 ඔක්තෝබර් මස 23 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා** පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනසූරි, දර්ශනපති, දර්ශනපති ව්‍යාපාර ආර්ථික විද්‍යාව, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, කළමනාකරණ විද්‍යාපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමණාකරණය පිළිබඳ විද්‍යාපති, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාව, ව්‍යවසායකත්වපති උපාධි පාඨමාලාව, වෘත්තිය ගිණුම්කරණ විද්‍යාපති, රාජ්‍ය කළමනාකරණපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ උපාධි අභිඥාන පත්‍රය, අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික ගණිතය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කළමනාකරණ පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, සමාජ සංඛ්‍යාන පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රයට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

1. <u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>

2022 ඔක්තෝබර් මස 14 (සිකුරාදා) , 15 (සෙනසුරාදා) සහ 16 (ඉරිදා) යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා සහ පස්වරු 1.00 සිට පස්වරු 4.00 දක්වා ඔබට අදාල පීඨයේදී උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.

- **උපාධි ප්‍රදානෝත්සව ගාස්තු ලෙස රු.8,000/= ක් ගෙවා ඇති උපාධිලාභීන්ගෙන් උපාධි ලෝගුව ලබා ගැනීම සඳහා රු.3,000/= ක ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ලබා ගන්නා අතර, එම මුදල ගෙවූ බව තහවුරු වූ පසු (බැංකු රිසිට්පත/මාර්ගගත ගෙවුම් ලදුපත ඉදිරිපත් කර) මෙම ලිපිය සමඟ ශිෂ්‍ය වාර්තා පොත පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් <u>(ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේ දී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>) උපාධි ලෝගුව ලබා ගත හැකිය.**

**උපාධි ලෝගුව හා සාටකය විශ්වවිද්‍යාලයට නැවත භාරදීමෙන් අනතුරුව උපාධි ප්‍රදානෝත්සව ගාස්තු ලෙස වැඩිපුර ගෙවා ඇති රු.1,000/= ක් හා උපාධි ලෝගුව සඳහා ගෙවා ඇති රු.3,000/= ක මුදල සමඟ මුලු මුදල රු.4,000/= නැවත ලබා දෙනු ලැබේ.**

- **උපාධි ප්‍රදානෝත්සව ගාස්තු ලෙස රු.7,000/= ක් ගෙවා ඇති උපාධිලාභීන්ගෙන් උපාධි ලෝගුව ලබා ගැනීම සඳහා රු.4,000/= ක ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ලබා ගන්නා අතර, එම මුදල ගෙවූ බව තහවුරු වූ පසු (බැංකු රිසිට්පත/මාර්ගගත ගෙවුම් ලදුපත ඉදිරිපත් කර) මෙම ලිපිය සමඟ ශිෂ්‍ය වාර්තා පොත පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් උපාධි ලෝගුව ලබා ගත හැකිය. (<u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේදී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>)**

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාළ ගිණුම් අංකය සහිත ආදර්ශ රිසිට් පත බාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර බාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය **2022 ඔක්තෝබර් මස 10 දිනට** පෙර සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee '**

**තවද විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පලකර ඇති පහත සඳහන් අයදුම්පත් 02 ද සම්පූර්ණ කර <u>උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී පීඨ කාර්යාලය වෙත අනිවාර්යයෙන්ම</u> <u>බාරදිය යුතු වේ.</u>**

1. **උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)**
2. **උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය (ඇමුණුම ii)**

**එලෙසම උපාධි ලෝගුව සහ සාටකය භාවිතා කිරීම සඳහා වන අචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතුවන අතර එම අචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පල කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.**
තවද කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුල උපාධි ලෝගු නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. **උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා චීවරපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබාගත හැකිය.**

2. **<u>ඇඳුම්:</u>**
කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක සාරි හෝ ඔසරිවලින් ද පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

3. **<u>පැමිණීම:</u>**
උපාධි ප්‍රදානෝත්සවය ආරම්භවීමට **<u>පැය එකහමාරකට පෙර</u>** බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

4. **<u>උපාධි පෙරහැරේ පෙළ ගැසීම:</u>**

ගිහි පැවිදි සියලුම උපාධිලාභින් පෙරහැරේ ගමන් කළ යුතුය. ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව පැළඳ පෙරහැරේ පෙළ ගැසිය යුතුය. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති පෙරහැර අංක පිළිවෙලට පෙළ ගැසිය යුතුය.

**<u>උපාධි සාටකය පැළඳ ගැනීම සිදුකළ යුත්තේ උපාධි සහතිකය ලබා ගැනීම සඳහා වේදිකාවට පිවිසෙන අවස්ථාවේදීය. ඉන් පසුව උපාධි ප්‍රදානෝත්සවය අවසන් වන තෙක් එය පැළඳ සිටිය යුතුය.</u>**

5. **<u>පෙරහැර අංකය පැළඳ සිටීම:</u>**

උපාධි සහතිකය නිවැරදිව ඔබට ලබා දීම සඳහා පෙරහැර අංකයක් උපාධි ලෝගුවේ අලවනු ලැබේ. උපාධි සහතිකය නිවැරදිව ලබා දීමේ පහසුව සඳහා ඔබ ප්‍රධාන වේදිකාවට පැමිණෙන අවස්ථාවේ දී එම අංකය උපාධි සාටකයෙන් නොවැසෙන පරිදි තබා ගත යුතු අතර, එය ඉතා ප්‍රවේශමෙන් අස්ථාන ගත නොවන ලෙස තබා ගැනීමට වගබලා ගත යුතුය.

6. **<u>වේදිකාව තුල දී උපාධි සහතිකය ලබා ගැනීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව ඔබගේ නම ප්‍රකාශ වෙත්ම එම අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය ප්‍රදානය කිරීමට නියමිතය.

7. **<u>උපාධි ලෝගුව සමඟ සාටකය ආපසු බාරදීම:</u>**

උපාධි ලෝගුව සමඟ සාටකය ඔබගේ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය යුතුය. යම් හෙයකින් එලෙස බාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීය කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සහ සාටකය භාර දිය හැකිය. නියමිත දිනට පෙර උපාධිලෝගුව බාරදීමට අපොහොසත් වුවහොත් දඩ මුදලක් අයකිරීමට සිදුවනු ඇත.

2022 ඔක්තෝබර් මස 28 (සිකුරාදා)
2022 ඔක්තෝබර් මස 29 (සෙනසුරාදා)
2022 ඔක්තෝබර් මස 30 (ඉරිදා)

උපාධි ලෝගුව සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සඳහා ගෙවන ලද ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව උපාධිලෝගුවට සහ / හෝ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

8. **<u>ප්‍රවේශ පත්‍ර:</u>**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගුව ලබා ගැනීමට පැමිණෙන අවස්ථාවේ දී නිකුත් කරනු ලැබේ. වාහනවලින් පැමිණෙන්නන් සඳහා වාහන ප්‍රවේශ පත්‍ර ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු 18 ට අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

9. **උපාධි පිරිනැමීම නිමාව:**

ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභින්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට බාධා හා අවහිරවලින් තොරව ඉඩකඩ සලසා ගත යුතු බැවින් ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී සහයෝගය දක්වන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි.

10. **ඡායාරූප ලබා ගැනීම:**

ඡායාරූප ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල ඡායාරූප ආයතනයක් තෝරා ගනු ලැබේ. විශ්වවිද්‍යාල නිල ලාංඡනය සහිතව ඡායාරූප නිකුත් කළ හැකි වනුයේ එම ආයතනයට පමණි. විශ්වවිද්‍යාලය මගින් අනුමත ඡායාරූපවල ප්‍රමාණයන් හා මිල ගණන් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් පසුව දැනුවත් කරනු ලැබේ. ඡායාරූප ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත අත්තිකාරම් ගෙවීම උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී කළ හැකිය.

11. උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලබා ගන්නා සියලුම උපාධිලාභීන්ගේ නාමලේඛන ඇතුලත් විශේෂ අතිරේකයක් 2022.10.23 දින Sunday Observer පුවත්පත සමඟ නිකුත් කරනු ලැබේ.

සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් මෙම උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන අතර එය සාර්ථක කර ගැනීම සඳහා පහත දක්වා ඇති උපදෙස්වලට අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

යූ.ඩී.එස්.එස්.ගුණසිංහ
නියෝජ්‍ය ලේඛකාධිකාරී / අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ලේඛකාධිකාරී වෙනුවට

**සැලකිය යුතුයි.**

- **සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ පිළිපැදීම සඳහා ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් විධිමත් පරිදි මුඛ ආවරණ පැළඳ සිටීම අනිවාර්ය වේ.**

- **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතුන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වැළකිය යුතුය.**

# <u>උපාධි ලෝගුව සහ සාටකය භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම</u>

## <u>උපාධි ලෝගුව</u>

1. උපාධි ලෝගුව පළඳින අවස්ථා
   i. උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවල දී
   ii. උපාධි ලෝගුව පැළඳිය යුතු වන උත්සව අවස්ථාවල දී

2. **<u>උපාධි ලෝගුව පැළඳිය යුත්තේ</u>**
   i. උපාධිලාභීන් සහ උපාධිධාරීන් පමණි

3. **<u>උපාධි ලෝගුව භාවිතා කිරීම</u>**
   i. උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිය පිරිනැමීමට නියමිත අවස්ථාවේ දී උපාධිලාභියා විසින් තම උපාධියට අදාළ ලෝගුව පැළඳිය යුතුය.
   ii. උපාධි ලෝගුව නිවැරදිව පැළඳිය යුතුය.
   iii. උපාධි ලෝගුව පැළඳීමේ දී සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුය.
   iv. උපාධි ලෝගුව උපාධිය සංකේතවත් කිරීම සිදු කරන බැවින් එය ඉතා ගෞරවාන්විතව භාවිතා කළ යුතුය.
   v. උපාධි ලෝගුවට අගෞරව නොවන ලෙස සුදුසු පරිසරයක සහ සුදුසු ඉරියව්වක සිට ඡායාරූප ගැනීම කළ යුතුය.
   vi. උපාධි ලෝගුව උපාධි ලාභියා විසින් පමණක්ම පැළඳිය යුතු වන අතර, අන්සතු කිරීම හා උපාධිධාරීන් නොවන අයට, ඥාතීන්ට, හිතමිතුරන්ට, පැළඳවීම නොකළ යුතුය.

## <u>සාටකය</u>

- සාටකය පළඳවනු ලබන්නේ උපාධිය පිරිනැමුණු බව සංකේතවත් කිරීම සඳහා වන බැවින් එය උපාධි ප්‍රදානෝත්සවය අවස්ථාවේ වේදිකාවට **ප්‍රවිශ්ඨවන විට** පැළඳිය යුතුය.